# මැයි මාසයේ...

මේ අන්දමට පහළ වැටුණු උද්ධමනය මේ වසරේ යළි සුළු වශයෙන් ඉහළ නැගුණි. ඒ අනුව මේ වසරේ අප්‍රේල් මාසය වන විට සියයට 3.6ක්ව පැවැති උද්ධමනය ඉකුත් මාසයේදී සියයට 3.5දක්වා පහත වැටුණි.

වසර 2017 මැයි මාසයේ සියයට 7.1ක් වූ උද්ධමනය ජූනි හා ජූලි මාසයන් වනවිට පිළිවෙළින් සියයට 6.3 දක්වා අඩුවිණි. නමුත්! අගෝස්තු මාසයේ සිට ඉහළ යැමක් වාර්තා කළ උද්ධමනය 2017 සැප්තැම්බර්, මාසය වන විට සියයට 8.6 දක්වා වැඩි වී ඇතැයි ජනලේ-ඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව උපුටා දක්වමින් මහ බැංකුව පවසයි.

නමුත් වසර 2018 ජනවාරි මාසයේදී සියයට 5.4 දක්වා පහත වැටුණු උද්ධමනය වසර අවසානයේදී සියයට 0.4 දක්වා පහත වැටුණු බවද මහ බැංකුව කියයි.

වසර ගණනාවක් මුළුල්ලේ තනි මැද අගයක් ගන්නා පරිදි උද්ධම-නය රඳවා ගැනීමට සමත්වී ඇති බව සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරමින් පවසන මහ බැංකුව, මේ වසරේ ජනවාරි සියයට 1.2ක්ද, පෙබරවාරි සියයට 2. 4ක්, මාර්තු මාසයේදී සියයට 2.9ක්ද විය. මේ වසරේ අප්‍රේල් මාසයේ දී මෙය සියයට 3.6 දක්වා ඉහළ නැගුණි. නමුත් මැයි මාසයේ සියයට 3.5 දක්වා පහත බැස ඇත.